

Cancer Screening Programs in Australia
(පිළිකා කල්තියා හඳුනා ගැනීමේ වැඩසටහන්)

වෛද්‍ය හර්ෂ අලුත්ගේ
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre

ප්‍රධාන පිළිකා වර්ග 3ක් සඳහා රෝගයට ගොදුරු වීමට ඉඩකඩ ඇති අය කල්තබා හඳුනා ගැනීමේ වැඩසටහන් (Screening Programs) ඕස්ට්‍රේලියානු රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

01. බඩවැල ආශ්‍රිත පිළිකා (Bowel Cancer)
02. පියයුරු පිළිකා (Breast Cancer)
03. ගැබ්ගෙල පිළිකා (Cervical Cancer)

ඉහත සඳහන් පිළිකා වර්ග 03ට ගොදුරු වීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් ඇති වයස් කාණ්ඩවල දැනට රෝග ලක්ෂණ කිසිවක් පෙන්නුම් නොකරන තැනැත්තන් මෙම පරීක්ෂණ නොමිළයේ සිදු කරවා ගැනීම සඳහා සුදුසුකම් ලබති.

මෙම පිළිකා වර්ග 3 සඳහා කෙරෙන පරීක්ෂණ එකිනෙකට වෙනස් වේ.

අප එම පිළිකා පිළිබඳ කෙටි හැඳින්වීමක් හා ඒ සඳහා ඇති පරීක්ෂණ (Screening Tests) මොනවාද යන්නත්, එම පරීක්ෂණ සඳහා සුදුසුකම් ලබන පුද්ගලයන් (Eligible Persons) කවුරුන්ද යන්නත් වෙන වෙනම සාකච්ඡා කරමු.

Bowel Cancer
(බඩවැල ආශ්‍රිත පිළිකා)

බඩවැල ආශ්‍රිත පිළිකා ඕස්ට්‍රේලියාවේ දෙවැනියට වැඩිම පිළිකා ආශ්‍රිත මරණ සංඛ්‍යාවකට වගකියන පිළිකා වර්ගයයි. (පෙනහලු පිළිකා පළමු තැන ගනී) නමුත් රෝගය කල්තියා හඳුනාගත හොත් මෙම පිළිකා රෝගීන්ගෙන් 90%ක් පමණ ප්‍රතිකාර මගින් සුවකර ගත හැකිය.

මෙම පිළිකාවේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මලපහ සමග රුධිරය පිටවීමයි. මෙය අපගේ ඇසට නොපෙනෙන ඉතා සියුම් රුධිර වහනයකි. (Faecral Occult Blood)

එබැවින් එවැනි රුධිර වහනයක් මලපහ සමග සිදුවේද යන්න කල්තියා පරීක්ෂා කර ගත හැකි නම්, වැඩිදුර පරීක්ෂණ සඳහා යොමුකර බඩවැල් පිළිකාවක් පවතිනම් ඉක්මන් ප්‍රතිකාර ආරම්භ කළ හැකිවේ.

මේ සඳහා සිදුකරන මලපහ පරීක්ෂාව (Faecral Occult Blood Test) යන්නයි. රජය විසින් පහත සඳහන් වයස් කාණ්ඩවල පසුවන අයට මලපහ එකතු කර යැවීම සඳහා පරීක්ෂණ කට්ටලයක් තැපෑලෙන් ලැබීමට සලස්වනු ලැබේ.

වයස අවුරුදු 55, 60, 64, 65, 70 හා 74 සම්පූර්ණ කළ උදවියට එම පරීක්ෂණ කට්ටලයේ ඇති උපදෙස් අනුව මලපහ එකතු කර ආපසු යැවීමෙන් සති කිහිපයකට පසුව ප්‍රතිඵල ඔබගේ පවුලේ වෛද්‍යවරයා වෙත නිකුත් කරනු ලැබේ.

මෙය National Bowel Cancer Screening Programe ලෙස හඳුන්වන ජාතික වැඩසටහනකි. වසර 2020 වනවිට වයස අවුරුදු 50 සිට 74 දක්වා වන සෑම ඕස්ට්‍රේලියානුවෙකුට අවම වශයෙන් වසර 2කට වරක්වත් මෙම පරීක්ෂණය සිදුකරවීම රජයේ සැලැස්මයි.

ඉහත වයස් කාණ්ඩවලින් පිටත අයට වුවද තමන්ගේ මලපහ කිරීමේ පුරුදුවල අසාමාන්‍යතාවයක් හෝ රුධිර වහනයක් පවතී නම්, විශේෂයෙන්ම තම පවුලේ හෝ ළඟම නෑදෑයෙකුට බඩවැල පිළිකා වැළඳී ඇතිනම් ඔබගේ පවුලේ වෛද්‍යවරයා හමුවී ඉහත කී පරීක්ෂාව සිදුකරවා ගත හැකිය.

Breast Cancer
(පියයුරු පිළිකා)

පියයුරු පිළිකාව ඕස්ට්‍රේලියානු කාන්තාවන්ගේ පිළිකා මගින් සිදුවන මරණ අතර දෙවැනි ස්ථානය ගනී. (පළමු තැන පෙනහළු පිළිකා) එසේම එය සමේ පිළිකා (Skin Cancer) හැරුණු විට කාන්තාවන්ගේ සුලභවම හමුවන පිළිකා වර්ගයයි. මෙය කල් තබා හඳුනාගත හොත් ඉක්මණින් ප්‍රතිකාර මගින් සුවකර ගත හැකිය.

මේ සඳහා කෙරෙන පරීක්ෂණය මැමෝග්‍රෑම් (mammogram) වශයෙන් හඳුන්වන X - Ray වැනි පරීක්ෂණයකි.

දැනට වයස අවුරුදු 50-74 අතර කාන්තාවන්ට වසර 2කට වරක් මෙම පරීක්ෂණය නොමිලයේ සිදුකරවා ගත හැකිය. ඒ සඳහා Breast Screen Australia විසින් ආරාධනා කරනු ලැබේ.

නමුත් වයස අවුරුදු 40-49 අතර මා 74 ට වැඩි කාන්තාවන්ට වුවද අවශ්‍යතාවක් ඇතොත් (විශේෂයෙන් පියයුරුවල ගැටිති, සමේ වෙනම්කම් හෝ වෙනත් සැකසහිත රෝග ලක්ෂණ පෙන්වයි නම් සහ තම පවුලේ හෝ ළඟම ඥාතියෙකුට පියයුරු පිළිකා වැළඳී ඇතිනම්) මෙම පරීක්ෂණය නොමිලේ කරවා ගත හැකිය.

මෙම පරීක්ෂණය ඉක්මනින් පියයුරු පිළිකා හඳුනාගෙන එමගින් වන මරන වළක්වා ගැනීමට මහඟු ලෙස උපකාරී වුවද එමගින් සිදුවන යම් අවාසියක්ද වෙයි.

Mammogram මගින් පියයුරු පිළිකා හඳුනා ගත්තද ඒවා වඩා හානිදායක හෝ අඩු හානිදායක ප්‍රභේදයක් ද යන්න වෙන්කර ගත නොහැකිය. එබැවින් මෙම පරීක්ෂණය මගින් වඩා හානිදායක නොවන සරල පිළිකාද හඳුනාගෙන (Over Diagnosis) ප්‍රතිකාරවලට යොමු කිරීම මගින් ඇතිවන මානසික, සමාජමය හා ආර්ථිකමය ගැටළු මෙහි ඇති අවාසිදායක පැත්තයි.

Cervical Cancer
(ගැබ්ගෙල පිළිකා)

ගැබ්ගෙල පිළිකා හඳුනා ගැනීමේ හොඳම ක්‍රමය වන්නේ Pap Test නැමැති පරීක්ෂාවයි. 1991 වසරේදී මෙම පරීක්ෂණය ඕස්ට්‍රේලියාවට හඳුන්වා දුන් පසු ගැබ්ගෙල පිළිකා මගින් ඇතිවන මරණ සංඛ්‍යාවේ පැහැදිලි අඩුවක් පෙන්නුම් කර තිබේ.

එසේම ගැබ්ගෙල පිළිකා ඇතිවීමේ ප්‍රධාන අවදානම් සාධකයක් වන Human Papillorna Virus Infection නැමැති වෛරස් ආසාදනය සඳහා එන්නතක් 2006 වසරේ සිට ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන හඳුන්වා දීමද මෙම අඩුවීමට හේතු සාදක වූවකි.

ලිංගික සබඳතා ආරම්භ කර වසර 2ක් ගත වූ පසු, වසස අවුරුදු 18 සිට 70 අතර කාන්තාවන්ට අවුරුදු 02කට වරක් මෙම පරීක්ෂාව නොමිලයේ සිදුකරවා ගත හැකිය.

ඔබගේ ගැබ් ගෙල ආශ්‍රිත ප්‍රදේශයෙන් පටක ස්වල්පයක් ලබාගෙන එය අන්වීක්ෂයක් මගින්

විශේෂ පරීක්ෂාවකට ලක්කර සෛලවල ඇතිවන වෙනස්කම් හඳුනා ගැනීම මෙහිදී සිදුකරනු ලැබේ.

මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල ආසාමන්‍ය වුවහොත් එහි බරපතලකම අනුව වසර 2කට වරක් කරන පරීක්ෂණය වෙනුවට මාස 6කට හෝ වසරකට වරක් මෙම පරීක්ෂාව කිරීමට නියම කරනු ලැබේ. එසේම බරපතල අසාමාන්‍යතාවයක් පෙන්නුම් කලහොත් නාරි හා ප්‍රසව වෛද්‍යවරයෙකු වෙත වැඩිදුර පරීක්ෂණ සඳහා යොමුකරනු ලැබේ.

ඉහත පිළිකා වර්ග 3 පිළිබඳව වඩා සවිස්තරව ඉදිරි ලිපි මගින් සාකච්ඡා කරමු.

Dias Maths
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
keerthicnc@yahoo.com
Home visiting
www.facebook.com/DiasMaths